**හලාවත ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හලාවත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.97,800ක වටිනාකමින් යුත් වත්කම් 04ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවක ණය ගිණුම රු.117,000ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | එම | එම |
| (ඇ) | වටිනාකම රු.5,874,430ක් වූ කර්මාන්ත 05ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |
| (ඈ) | කොටස් කරන ලද ඉඩම් 11ක මාර්ග සඳහා ලබාදුන් ඔප්පුවල වටිනාකම වන රු.1,415,000ක් ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | එම | එම |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අතර එකතු වටිනාකම රු.20,138,990ක වෙනසක් විය. | 2023 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | උප ලේඛන ශේෂ හා ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,837ක නිරවුල් නොවූ හර ශේෂයක අවිනිශ්චිත ගිණුමක් පැවතුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මු.රෙ.371 (ඇ) | එකතු වටිනාකම රු.162,801ක් වූ අත්තිකාරම් 05ක් අදාළ කාර්යය නිම කළ විගස පියවා නොතිබුණි. | අදාළ කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතු බවට ලිඛිතව දැනුවත් කිරිමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 571(2) වගන්තිය | වසර 02ක් ඉක්මවූ රු.4,064,973ක් වටිනා තැන්පතු 170ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 129(2) (අ) (ආ) සහ (ඊ) වගන්ති | ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු, උසාවි දඩ හා බදු කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | | | |
| | (i) අංක 5(7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සියලුම විෂය පථයන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) අංක රීතිය | 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා හා සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) අංක රීතිය | 218 | සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකට වරක්ම පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කළ යුතු වුවද එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | පත්කර ගන්නා ලද පරීක්ෂණ මණ්ඩලයක් විසින් ස්ථානීය පරික්ෂාවක් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.144,347,101ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.87,785,753ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 33,534 | 11,392 | 11,667 | 4,667 | 9,393 | 11,352 | 9,331 | 5,096 |
| කුලී | 9,625 | 9,215 | 9,342 | 4,388 | 10,153 | 11,904 | 9,755 | 3,041 |
| බලපත්‍ර ගාස්තු | 1,050 | 1,132 | 1,132 | - | 1,380 | 980 | 980 | 360 |
| වෙනත් ආදායම් | 12,177 | 10,202 | 32,695 | 128 | 37,641 | 11,384 | 11,263 | - |
| එකතුව | 56,386 | 31,941 | 54,836 | 9,188 | 9,182 | 35,620 | 31,329 | 8,497 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.4,352,640ක්, හිඟ අක්කර බදු රු.314,759ක් සහ හිඟ කුලී රු.4,388,406ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.136,744,037ක් සහ රු.309,467,505ක් විය. ඉන් වර්ෂ 01ට අඩු උසාවි දඩ රු.40,500,000ක්ද වර්ෂ 01ට වැඩි 03ට අඩු රු.96,244,037ක්ද වර්ෂ 01ට මුද්දර ගාස්තු රු.110,000,000ක්ද වර්ෂ 01ට වැඩි 03ට අඩු රු.199,467,506ක්ද විය. | නිවැරදි ලෙස යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුන්නේෂ්වරම විශ්‍රාම ශාලාව වර්ෂ 03ක කාලයක් සඳහා බදු දී ඇති අතර 2023 ජූනි 30 දිනට හිඟ කුලී ආදායම රු.1,633,764ක් විය. බදු ගිවිසුමෙහි 04 වන වගන්තිය ප්‍රකාරව කුලී නොගෙවන්නේ නම් බදු ගිවිසුම අවලංගු කළ හැකි වුවත් එසේ කර නොතිබුණි. | අවශ්‍ය නීතිමය කටයුතු සඳහා යොමු වී ඇති බව. | හිග මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මාදම්පේ පරිසර තොරතුරු මධ්‍යස්ථානයේ ඉහළ මහළ වසර 02ක් සඳහා රු.444,000ක මුදලකට බදු දී තිබූ අතර 2023 අගෝස්තු වන විට අයවිය යුතු හිඟ මුදල රු.164,320ක් විය. මුදල් නොගෙවීම මත ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 අංක 01 දරණ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය නිකුත් කර තිබුණු අතර එයට අනුව ලියාපදිංචි වන්නා වූ ප්‍රජා මූල සංවිධානවල කාර්යයන්, වත්කම් හා වගකීම් අධීක්ෂණය, විමර්ශනය හා උපදෙස් දීම පිළිබඳ බලය එකී ප්‍රජා මූල සංවිධානය පිහිටි බල ප්‍රදේශයට අයත් පළාත් | ක්‍රියාකාරී සංවිධාන පමණක් ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. | ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාලන ආයතන වෙත පවරා තිබූ අතර හඳුනාගන්නා ලද ප්‍රජාමූල සංවිධාන 15ක් ලියාපදිංචි කරවීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රජා මූල සංවිධානවල විවිධ අක්‍රමිකතාවයන් සහ ගැටළු අධීක්ෂණය කර නොතිබුණි. | | |
| (ආ) | (i) 2019 සිට 2023 දක්වා කාලය තුළ කර්මාන්ත 09කට අදාළ ව්‍යාපාර 186ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සිදු කර නොමැති අතර ඒ සම්බන්ධයෙන් සභාව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | කර්මාන්තකරුවන් විසින් පරිසර බලපත්‍ර ලබා ගනිමින් පවතින බව. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කර්මාන්තකරුවන් යොමු කළ යුතුය. |
| | (ii) 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය 21 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/ බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයෙහි පොදු නියම හා කොන්දේසි 01 අනුව බලපත්‍ර ලබා නොගත් අවස්ථා 71ක් විය. | නිසි කාලසීමාවේදී බලපත්‍ර ලබා ගැනීම අත්‍යාවශ්‍ය බව කර්මාන්තකරුවන් වෙත දැනුම් දී ඇති බව. | ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පෙර වර්ෂවල ඉටුනොකරන ලද කර්මාන්ත වෙනුවෙන් ණයහිමි කර තිබූ වටිනාකම රු.32,079,400ක් වූ අතර කර්මාන්ත 05ක් 2023 දෙසැම්බර් 31 දින වන විටදීත් ඉටු කර නොතිබුණි. | කර්මාන්තයන් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | කර්මාන්ත ඉටු කිරීමට හෝ ඉටු නොකරන්නේ නම් ණයහිමියන්ගෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.19,726,708ක් වූ අතර ඒ තුළ අවුරුදු 03 ඉක්ම වූ රු.1,711,608ක ශේෂයක්ද විය. | අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.107,937,367ක් වූ අතර ඉන් අවුරුදු 03කට වැඩි රු.4,741,372ක් විය. | ශේෂය නිරවුල් කිරීමට ඉදිරි කටයුතු සිදු කරන බව. | ණයහිමියන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 දිනැති 2019/02 දරන චක්‍රලේඛයට පටහැනිව කඩ කාමර 29ක් සඳහා පැරණි තක්සේරුව මත ගාස්තු අයකර තිබුණි. | කඩ කාමර නව තක්සේරුව සඳහා යොමු කිරීමට කටයුතු කර ඇති බව. | නව තක්සේරුවක් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවට අයත් පොදු ඉඩම් කට්ටි 40ක පොල් එලදාව බදුදීමට කටයුතු කර නොතිබුණි. | බදු කරුවන් ඉදිරිපත් නොවීම මත බදු දීම සිදු කර නොමැති බව. | සභාවේ වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් ඉඩම් 43ක් පැවති අතර ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එම ඉඩම් සියල්ල පවරා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම් කට්ටි කිරීමේදී සභාවට පවරන ලද පොදු ඉඩම් 40 වටා වැටවල් ගසා ඒවායෙහි ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | නාම පුවරු ප්‍රදර්ශනය කිරීමටත් කටයුතු කරමින් සිටින බව. | නාම පුවරු ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රත්මල්අගාර, බුලත්හන්දියේ ටියුරින් ඉඩමේ ප්‍රාදේශීය සභාව සතු පර්චස් 40ක ඉඩම සභාවට අයත් බව තහවුරු කරගෙන නොතිබුණි. | සභාවට ඔප්පු අංක 2547 මඟින් ලබා දී ඇති බව විෂය නිලධාරී විසින් තහවුරු කර ඇති බව. | සභාවට අයත් ඉඩම් මොනවාද යන්න නිවැරදිව තහවුරු කරගත යුතුය. |
| (ඈ) | වැල්පොතුයාය නොහොත් පුලියන්කඩවර කැලේ නැමති අක්කර 9 රූඩ් 01 පර්චස් 15ක ඉඩම කොටස් කිරීමට අදාළව ලබාදිය යුතු සියයට 1 බදු මුදල ලබාදී නොතිබූ අතර පොදු ඉඩම් කොටස සඳහා වූ ඔප්පුව ලබා දී තිබුණි. | ඉඩම් කොටස් කිරීමෙන් සභාවට ලබා දිය යුතු 1 % ක බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | සියයට 1 බදු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අක්කර 07 රූඩ් 01 පර්චස් 12.4ක් විශාල කහටගහවත්ත නොහොත් කොරකහවත්ත 2022 වර්ෂයේදී කොටස් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා තිබූ අතර මේ වන තෙක් සංවර්ධන කොන්දේසි සම්පූර්ණ කර නොමැති බැවින් අනුමැතිය ලබාදී නොතිබුණු අතර සියයට 1ක බදු මුදල ලබා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | බදු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | සියයට 1 බදු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් තිත්තකඩේ කැලේ (මෛත්‍රී උයන) කට්ටි කර විකිණීමෙන් පසු සභාවට අයත් විය යුතු පර්චස් 373ක පොදු ඉඩම් කොටස ඔප්පුවකින් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් ඔප්පුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | සභාවට අයත් ඉඩම් කොටසට අදාළ ඔප්පුව කඩිනමින් ලබා ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ගිවිසුම්ගත වූ නමුත් වැඩ ආරම්භ කර නොතිබූ කර්මාන්ත 56ක ගිවිසුම්ගත වටිනාකම රු.37,874,138ක් විය. | වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව. | අදාළ වර්ෂයේ නිම කිරීමට සැලසුම් කරන ලද කර්මාන්ත එම වර්ෂයේදීම නිම කර අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2021 ප්‍රකාරව 2023 වර්ෂයේ කර්මාන්ත 104ක් ප්‍රජා පාදක සංවිධාන විසින් ඉටු කර තිබීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපාදේශ සංග්‍රහයේ 1.2ට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බලාපොරොත්තු වන සභාවට වාසි සහගත වන තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 කර්මාන්ත ප්‍රජා පාදක සංවිධාන මගින් ඉටු කිරීමට තීරණය කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් තරගකාරී මිලකට අදාළ කර්මාන්ත කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී පුලියන්කඩවර සෙල්වින්වත්ත ක්‍රීඩාපිටියේ දැල් ආවරණයක් සැකසීම සඳහා රු.199,288ක මුදලකට චිත්ත සමාධි වැඩිහිටි සමිතිය සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර ඇස්තමේන්තුව අනුව සම්පූර්ණ වැඩ කොටස් නිම නොකර අතර මඟ අත්හැර දමා තිබුණි. | කර්මාන්තය නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | රජයේ අරමුදල් කාර්යක්ෂම හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ද්වීතියික තනතුරු 17ක්ද ප්‍රාථමික තනතුරු 37ක්ද පුරප්පාඩු වී තිබූ අතර ද්වීතියික තනතුරු 16ක් හා ප්‍රාථමික තනතුරු 27ක් අතිරික්තව පැවතුණි. | ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර නිසි පිළිතුරක් අප වෙත ලැබී නොමැති බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන එම සේවක ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය, වැඩ තහනම් කල හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 48 දෙනෙකුගෙන් රු335,560ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | හැකියාවක් ඇති නිලධාරීන්ගෙන් අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.9 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හලාවත ප්‍රාදේශීය සභාවට අයත් වාහනයක අනතුරු නිසා සිදු වී ඇති රු.373,630ක අලාභය 2023 නොවැම්බර් 15 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | 2028 ජනවාරි දක්වා අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල අයවැය ඇස්තමේන්තු මඟින් වැය විෂයයන් 34කට අදාළව සලසා තිබුණු රු.16,116,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාළ අයවැයගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | ඉදිරි අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මේ පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කරන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) තවද සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 30ක් සඳහා සලසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් එම වැය විෂයයන් සඳහා වැයකර තිබුණේ සියයට 50කටත් අඩු ප්‍රමාණයකි. | ඉදිරි අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මේ පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කරන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සියඹලාගස්වෙල වෙල්යායේ පම්බල රේල් බෝක්කු අසළ ඇළ මාර්ගයේ අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | ඉතා ඉක්මනින් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා උත්සහා ගන්නා බව. | ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 4.3 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 10ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ ක්‍රියාකාරකම් 19ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් 13ක ප්‍රගතිය සියයට 49ට වඩා අඩු මට්ටමක පැවතුණි. | ඉදිරියේදී තිරසර සංවර්ධන ඉලක්ක වඩාත් ප්‍රශස්ථ මට්ටමින් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |